| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| **11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** |

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 1 යි

<u>උපදෙස්</u>

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

★ **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

01) ජනකවියට **<u>අලගුතියන්නවත්</u>** බැරි නිර්මාණ වර්තමාන සමාජයේ බහුල ලෙස දක්නට ඇත.
1) ඉහළින් තැබිය නොහැකි 2) සුළුවෙන් හෝ සමාන කළ නොහැකි
3) ආදර්ශ ලැබිය හැකි 4) අභියෝගයක්ව පවතින

02) තමන්ගේ අරමුණ ඉටුකර ගැනීම හමුවේ කවරෙකු හෝ **<u>දඬමීමා කර ගැනීමට</u>** ඔහු පසුබට නොවේ.
1) ආරක්ෂා කර ගැනීමට 2) අනතුරකට පත් කිරීමට
3) වර්ණනාවට ලක් කිරීමට 4) අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමට

03) ඔහුගේ **<u>පොරකටු ගෙවී ඇති බව</u>** ඔහු නොදන සිටීම කණගාටුවට හේතු විය.
1) බලය පිරිහී 2) නිෂ්ඵල ක්‍රියාවක යෙදීම
3) බොරු කියමින් මවා පෑම 4) පිහාටු කැඩී යාම

★ **අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04) ........................ පරිදි මහා වර්ෂාවක් කඩා වැටීමෙන් ක්‍රීඩා තරඟය අතහැර දැමීමට සිදුවිය.
1) නිශ්චිත 2) විස්මිත 3) අපේක්ෂිත 4) අනපේක්ෂිත

05) ප්‍රතිභාපූර්ණ නිර්මාණකරුවෙකුගේ විශිෂ්ට ලක්ෂණය වනුයේ ........................භාෂාවක් භාවිත කිරීමයි.
1) නිශ්චිතාර්ථවත් 2) ව්‍යංග්‍යාර්ථවත් 3) ගූඪාර්ථවත් 4) සංශයාර්ථවත්

06) වර්තමාන ශිෂ්‍ය පරම්පරාව වෙතින් කෙමෙන් කෙමෙන් ආත්ම ........................... ඉවත්වනු පෙනෙයි.
1) අධීක්ෂණය 2) ශික්ෂණය 3) සමීක්ෂණය 4) හිංසනය

07) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1) විශ්මය, පුස්තකාලය, ප්‍රදර්ශනය, ඖෂධ
2) විශ්ලේෂණය, ශ්‍රවණාගාරය, පර්යේක්ෂණය, පරිඝණකය
3) නිෂ්කලංක, නිශ්ශබ්ද, සංගායනාව, තීරණය
4) සමස්ත, විශිෂ්ට, කනිෂ්ඨ, ගවේෂණය

08) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
1) හංස සංදේශය, අමාවතුර, දළදා සිරිත, පූජාවලිය
2) මඩොල්දූව, විජයබා කොල්ලය, රන්මුතුදූව, ගම්පෙරළිය
3) ගිරා සංදේශය, බුත්සරණ, බුදුගුණාලංකාරය, සඳකිඳුරුදාකව
4) කාව්‍යශේඛරය, බෝධිවංශය, ජාතක පොත, ධර්මප්‍රදීපිකාව

09) සුවඳ, බෞද්ධ, සීගිරි, මේසය යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   1) කෙටි පාපිල්ල, කොම්බුව සහ ගයනුකිත්ත, දීර්ඝ ඉස්පිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය
   2) කෙටි පාපිල්ල, කොම්බුව සහ දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ ඉස්පිල්ල, කොම්බුව සහ ගයනුකිත්ත
   3) කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, කොම්බුව හා ගයනුකිත්ත
   4) කෙටි පාපිල්ල, කොම්බුව හා ගයනුකිත්ත, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ ඉස්පිල්ල

10) "දන" යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ
   1) කණ්ඨජ    2) දන්තජ    3) තාලුජ    4) මූර්ධජ

11) අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   1) දරුවා, ඇතකු, මිනිසුන්, ඌරෝ    2) අයෙකු, ධනවතුන්, අප, දැරියක
   3) වංශවතෙක්, ගායිකාවක, කුරුල්ලෙකු, මා    4) කාන්තාවක, ගොන්නු, කපුටෙකු, හාවෙකු

12) "අම්මා බස් රියෙන් බිමට බැස්සා ය." යන වාක්‍යයේ "බස් රියෙන්" යන්නෙහි විභක්තිය කුමක්ද?
   1) කර්ම    2) කරණ    3) ආධාර    4) අවධි

13) "සුමිහිරි" යන්න අයත් වන්නේ,
   1) විභක්ති සමාසයට    2) දකාරාර්ථ සමාසයට
   3) අව්‍ය සමාසයට    4) විශේෂණ සමාසයට

14) "උද්යෝගයෙන් කටයුතු කළ ගොවීන් විසින් මේ කන්නයේ සරු අස්වැන්නක් ලබන ලදි." යන වාක්‍යයේ අනුක්ත කර්තෘ පදය ලියන්න.
   1) ගොවීන්    2) අස්වැන්නක්    3) මේ කන්නය    4) උද්යෝගයෙන්

15) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත පිළිතුර තෝරන්න.
   1) නිපාත - තෙක්, ඊයෙ, අනතුරුව, සිට
   2) සන්ධි - ශාලාධිපති, අරුණෝදය, නැණැති, දකුණත
   3) ක්‍රියා - අසන්න, හඬද්දී, වැස්සොත්, ගයමින්
   4) තද්ධිත - සිල්වත්, රත්රන්, නාගරික, සෙල්මුවා

16) මිශ්‍ර ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක්ද?
   1) ශිෂ්‍යයා පොත බලමින් රචනාවට කරුණු රැස් කළේ ය.
   2) නිල්වලා පෙළ ආකාශයේ ඈතින් ඈතට ගමන් කළේ ය.
   3) හෝර්ටන් තැන්න සුන්දර පරිසර කලාපයකි.
   4) ජීවිතය සම්පූර්ණ වීමට සාහිත්‍යය කලා රසවින්දනය ද අවශ්‍ය ය.

★ **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

17) **<u>ප්‍රත්‍යුපකාර</u>** කරන්නෝ අප සමාජයේ විරල වෙති.
   1) පරෝපකාර    2) නැවත උපකාර
   3) නොකඩවා උපකාර    4) ස්වයං උපකාර

18) ඇය **<u>එකුන් විසි</u>** වන වියට එළැඹියා ය.
   1) විසි එක්    2) තිස් එක්    3) දහනව    4) විසිනව

19) ගංවතුරෙන් **<u>අවිනෂ්ට වූ</u>** දේවල් දැක ඔවුහු පුදුම වූහ.
   1) විනාශයට පත් වූ    2) විනාශයට පත් නොවූ
   3) විකෘති වූ    4) ප්‍රතිසංස්කරණය කළ

20) විරුද්ධාර්ථ පද යුගලයක් නොවන්නේ
   1) බුහුමන - අවමන    2) පැණසර - ප්‍රාඥයා
   3) අහංකාර - නිරහංකාර    4) විකසිත - මුකුලිත

21) එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
1) ගැබ - ගර්භය, ශීර්ෂය - හස්තය, ළය - හෘදය, සිගාල - හිවල්
2) පවන - නල, සුර - නර, අහස - ගුවන, මළුව - මාලකය
3) දන්ත - දත්, ප්‍රාකාරය - පවුර, භූමිය - බිම, ලතා - වැල
4) රථය - රිය, පාංශු - පස්, උච්චය - පර්වතය, සර - ගිර

22) "මිතුරා පැමිණ තම සැපදුක් බලද්දී ඔහු සතුටු විය." මෙම වාක්‍යයේ ඇති ක්‍රියා පද පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.
1) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
2) පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
4) ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

23) ඕෂ්ඨජ අක්ෂර පමණක් අන්තර්ගත වචනය තෝරන්න.
1) උපමා
2) මව
3) බටය
4) පවන

24) ද්විත්ව රූප සන්ධියට උදහරණයක් නොවන්නේ
1) පත්තිරු
2) දුප්පත්
3) දුන්නක්
4) රුක්කත්තන

25) වැරදි අදහස දෙන වාක්‍යය තෝරන්න.
1) ප්‍රබල යන්නෙහි "ප්‍ර" යනු උපසර්ගයකි.
2) බුජබල යන්නෙහි අර්ථය බාහුබල යන්නයි.
3) අද යනු කාලාර්ථයේ නිපාත පදයකි.
4) 'කියත උන් මෙතෙපල' යන්නෙහි 'කියත' පූර්ව ක්‍රියා පදයකි.

★ **26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

26) කලකදි වහලු කලකදි රස වෙනවාලු
1) වැරදි කරමින් අනුන්ට දැනමුතුකම් දීම
2) කලක් සතුරුව සිටි අය පවා පසුව මිතුරන් වන බව
3) එක් කරදරයක් පිට තවත් කරදරයක් ඒම
4) හොඳ දෙයින් අයෙකුට විපත් පැමිණීම

27) තමන් කළ වරද තමන්ට ම දැනීම
1) හිල් කුඩෙන් වතුර ඇදීම වගේ
2) අනුන්ට කැපූ වළේ තමන් වැටීම වගේ
3) අබ කෑ මිනිහගේ නහය දනවා වගේ
4) අටුවෙන් දුමට පැන්නා වගේ

28) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,
A- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
B- මෙරමා - අන්‍යන්ගේ
C- වෙහෙල් කැල - ගව සමූහයා
D- නඩු හබ - යුගල පද
1) A, B හා C ය
2) B, C හා D ය
3) A, B හා D ය
4) A, C හා B ය

★ **29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29)
1) මම රෝගී වී සිටින හිතවතෙක් බැලීමට රෝහලට ගියෙමි.
2) අයෙක් ප්‍රීතියෙන් කෑ ගැසුවේ ය.
3) ඔවුන් උත්සවයට පැමිණෙති'යි අපි සිතුවෙමු.
4) සංචාරකයන් මඟ පෙන්වන්නන්ගේ සහාය පැතුහ.

30)
1) ගැමියන් විසින් වන අලින් පලවා හැරියහ.
2) රෝගී දරුවෙකු ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් විය.
3) ඇස් ඇත්තෝ මේ විපත දකිත්වා !
4) ඇගේ උත්සාහය කවුරුත් අගය කළා ය.

31) "වැඳ රද පද කමල" යන පාඨයෙහි ඇතුළත් අලංකාර දෙකක් වන්නේ
1) ධ්වනිථාර්ථය - රූපක
2) අනුප්‍රාසය - රූපක
3) අනුප්‍රාසය - උපමා
4) ව්‍යංග්‍යාර්ථ - ස්වභාවොක්තිය

32) හිස් තැනට සුදුසු පද ගළපන්න.

- මව්පියෝ තම දරුවන් පණ ……….. සුරකිති.
- උවසු උවැසියෝ විහාරස්ථානය …………….. පිය නැගූහ.
- ඇය විවාදයේ දී දක්ෂ ලෙස බස හසුරුවන ……………… මම දුටුවෙමි.
- ඔහු අසනීපයෙන් පසු වූ ………………… රැස්වීමට සහභාගී විය.

**E - නමුදු** **F - මෙන්** **G - අයුරු** **H - වෙත**

1) E F H G 2) H F G E 3) G H F E 4) F H G E

33) "කතා බහෙන් සිනාසෙමින් - ජීවිතයේ ගිරිදුර්ගය
නඟින
සොඳුරු ගැහැනිය ඔබ"
ඉහත පද්‍ය ඛණ්ඩය රචනා කරන ලද්දේ

1) මහගම සේකර මහතා විසිනි
2) මොනිකා රුවන්පතිරණ කිවිඳිය විසිනි
3) සිරි ගුනසිංහ මහතා විසිනි
4) විමල් දිසානායක මහතා විසිනි

34) සයිමන්, අසඩක්, නටාලියා යන චරිත ඇතුළත් නාට්‍යය කුමක්ද?

1) මනමේ
2) නරිබෑනා
3) හුණුවටයේ කතාව
4) තල මල පිපිලා

35) හේන් වගාව ආශ්‍රිත බස් වහරේ "බූඩා" යනු

1) අලියා 2) වයසක මිනිසා 3) මඟුල් කපුවා 4) මී හරකා

36) පහත සඳහන් පාඨය ඇතුළත් කෙටි කතාව තෝරන්න.
"ළමයෝ ගෙදර දූවපන් - අපි අද රෑ මෙහි නතර වෙනවා."

1) මං තනන්නෝ
2) වතුරමල
3) තොරොක්කෝව
4) අපට වැසිකිළියක්

37) පහත සඳහන් කවියෙහි තුන්වෙනි පදය තෝරන්න.
"එවන් ලෙයින් උපන් පුතේ
සුරු විරුකම් ඔබට ඇතේ
………………………………
මව්බිම දෙස බලන් පුතේ"

1) ඉදි කළ වැව් බලන් පුතේ
2) දැ උරුමය ඇති ව සිතේ
3) ඒ මහ වැව් බැඳුණෙ පුතේ
4) පියකරු බව ඇතත් වතේ

38) "මෙන්න මේ විවිධ ශබ්ද හා සංයුති සඳහා **<u>සම්මුතියකට</u>** පැමිණීම භාෂාවේ උපත හැටියට හඳුන්වන්න පුළුවන්"
මෙහි ඉරි ඇඳ ඇති පදයේ අර්ථය සහිත වරණය තෝරන්න.

1) සාකච්ඡාවකට
2) විවාදයකට
3) කැමැත්තකට
4) එකඟතාවයකට

39) "වළට පැන ඒ පුරුෂයා ඇඟ වහවාගෙන වේග දනවා ගොඩට පැන විඩාව ගොස් එකියන පුරුෂයා කෙරෙහි නිස්සංක ව උකුලෙහි ඉසතබා වැදහොත්තේ ය." මෙය උපුටාගත් කෘතිය වන්නේ,

1) සද්ධර්මරත්නාවලිය
2) රාජාවලිය
3) සිළුමිණ සඟරාව
4) පන්සිය පනස් ජාතක පොත

40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
**රස වින්දනයට බස දැන ගැනීම අවශ්‍ය වන අතර කාව්‍ය රස වින්දනය හේතු කොට ගෙන බස පිළිබඳ දැනුම ද වර්ධනය වේ.**

1) භාෂාව නොදන රසවින්දනය කළ නොහැකි අතර භාෂා දැනුම කාව්‍ය රසවින්දනයට බාධාවක් නොවේ.
2) භාෂා දැනුම ලැබෙන්නේ කාව්‍ය රස වින්දනයට යොමු වීම තුළින් පමණකි.
3) බස දැන ගැනීමෙන් රසවින්දනය හොඳින් කළ හැකි අතර භාෂා දැනුම තීව්‍ර වීමට කාව්‍ය රසවින්දනය හේතු වේ.
4) භාෂා දැනුම කාව්‍ය රසවින්දනයට බලපාන අතර එය රසවින්දනයට බාධාවක් නොවේ.